museum of modern
and contemporary art
sri lanka

## MMCA ශ්‍රී ලංකා ‘අක්කර 88: මිනෙට් ද සිල්වා විසින් කළ වටපුළුව නිවාස යෝජනා ක්‍රමය’ විවෘතකරයි

ශ්‍රී ලංකා නූතන හා සමකාලීන කලා කෞතුකාගාරය (MMCA ශ්‍රී ලංකා) ‘අක්කර 88: මිනෙට් ද සිල්වා විසින් කළ වටපුළුව නිවාස යෝජනා ක්‍රමය’ ලෙස නම් කෙරුණු සිය නව ප්‍රදර්ශනය නොවැම්බර් 30 වැනිදා, කොළඹ 03, ක්‍රෙස්කැට් බුලෙවාර්ඩ්හි බිම් මහලේ පිහිටි කෞතුකාගාර පරිශ්‍රයේදී විවෘතකළේ ය. අභිරක්ෂණ සහායක තිනාල් සජීව සහ නිමායා හැරිස් සමග ශාර්මිණී පෙරේයිරා සහ රිවෙල් මර්සලින් විසින් අභිරක්ෂණයකර ඇති ‘අක්කර 88’, MMCA ශ්‍රී ලංකාහි ප්‍රථම ඒක පුද්ගල ප්‍රදර්ශනය වෙයි. එය වටපුළුව නිවාස යෝජනා ක්‍රමය හා ශ්‍රී ලාංකික ගෘහනිර්මාණ ශිල්පී මිනෙට් ද සිල්වාගේ (1918–1998) පුරෝගාමී නිර්මාණ කාර්යයන් දෙස බලයි.

මෙම ප්‍රදර්ශනය නාභිගතවන්නේ මිනෙට් ද සිල්වා විසින් නිර්මාණ සැලසුම්කරණය කළ, 1958දී විවෘතකෙරුණු මහනුවර වටපුළුව නිවාස යෝජනා ක්‍රමය මතයි. මෙම යෝජනා ක්‍රමය ශ්‍රී ලංකාව තුළ සමාජ නිවාසකරණයේ නව ස්වරූපයක පෙරමඟ දැන්වූ අතර, විශේෂයෙන් ම එහි පරිශීලකයන්ගේ සහභාගීත්වයෙන් නිර්මාණයකෙරුණි. ශ්‍රී ලංකාවේ බහුවිධ වාර්ගික-ආගමික රාජ්‍ය සේවකයින් ප්‍රජාවකට දැරිය හැකි මිලකට නවාතැන් සපයා දුන් මෙම විශාල භූමි භාගයක විසිරුණු කඳුකර සංවර්ධනය, එම යුගයට පෙරටුව සිටියේ කෙසේදැයි යන්න ‘අක්කර 88’ ගවේෂණයකරයි. ඉරුෂි තෙන්නකෝන් (උ. 1989), සුමේධ කැලේගම (උ. 1988), සහ සුමුදු අතුකෝරල (උ. 1980) නිර්මාණයකළ විශේෂයෙන් පැවරුණු කලාකරුවන්ගේ චිත්‍රපටයක් සමඟින් ‘අක්කර 88’ මෙම යෝජනා ක්‍රමය දෙස වසර 65කට පසුව හැරී බලන්නේ ද සිල්වාගේ බලපෑම සහ ඇගේ නිර්මාණ ප්‍රවේශයේ අභියෝග සළකා බැලීමටයි.

“මිනෙට් ද සිල්වාගේ ගෘහ නිර්මාණ ශිල්පීය පරිචය පිළිබඳව ප්‍රත්‍යවලෝකනයක් කරනවාට වඩා, ඇයගේ නිර්මාණ කාර්ය සවිස්තරාත්මකව අධ්‍යනයකිරීමට අපි තනි ව්‍යාපෘතියක් කෙරෙහි අවධානය යොමුකරනවා. එය මෙතෙක් සිදුකළ නොමැති දෙයක්,” යැයි MMCA ශ්‍රී ලංකාහි ප්‍රධාන අභිරක්ෂක ශාර්මිණී පෙරේයිරා පැවසුවා ය. “මෙම ප්‍රදර්ශනය අභිරක්ෂණයකිරීමේ අභියෝගය වූයේ, ද සිල්වාගේ ගෘහ නිර්මාණ ශිල්පීය පරිචය වන The Studio of Modern Architecture හි මුල් සිතුවම් හෝ ආකෘති කිසිවක් නොමැතිවීමයි.

Groundfloor, Crescat Boulevard
89 Galle Road
Colombo 03

Registered Address:
117 Sir Chittampalam A. Gardiner Mawatha
Colombo 02
Sri Lanka

info@mmca-srilanka.org
www.mmca-srilanka.org

එමනිසා අපිට යෝජනා ක්‍රමය පිළිබඳ පර්යේෂණය සඳහා කලාකරුවන් තිදෙනෙකු සම්බන්ධ කරගත් වෙනස් ප්‍රවේශයක් ගැනීමට සිදුවූ අතර, පසුව එය සජීවීකරණ චිත්‍රපටයක් ලෙසට නිමැවුණි. ඔවුන්ගේ පර්යේෂණයට යෝජනා ක්‍රමයේ පදිංචිකරුවන් හා සම්මුඛ සාකච්ඡා පැවැත්වීම සහ පුරාලේඛීය පර්යේෂණ ඇතුළත්වූ අතර, එය වටපුළුව නිවාස යෝජනා ක්‍රමය පිළිබඳ වඩාත් ම යාවත්කාලීනවූ පුරාලේඛන ගොනුව නිර්මාණය කර ඇත. එය අන් අය විසින් තවදුරටත් ගොඩනැගෙනු ඇතැයි අපි බලාපොරොත්තු වෙනවා," යැයි ඇය තවදුරටත් සඳහන්කළා ය.

50 දශකයේ මුල් භාගයේ සිට ශ්‍රී ලංකාවේ පාරිසරික, සමාජයීය, සහ දේශපාලනික විපර්යාස ප්‍රකාරව වටපුළුව නිවාස යෝජනා ක්‍රමය සාක්ෂි දරන්නේ කුමකටදැයි සළකාබැලීමට, තෙන්නකෝන්, කැලේගම, සහ අතුකෝරල නිර්මාණයකළ 'is this an architectural documentary' (2023) සජීවීකරණය, සංරක්ෂිත ඡායාරූප, චිත්‍රපට පටිගතකිරීම්, සහ සාක්ෂිකරුවන්ගේ ප්‍රකාශ සම්මිශ්‍රකරයි. "මේ ව්‍යාපෘතිය ආරම්භයේදී, චිත්‍රපටයක් හරහා ගෘහ නිර්මාණ ශිල්පය ගැන කතාවක් කියන්නේ කොහොමද කියන ප්‍රශ්නයට අපිට මුහුණ දෙන්නට සිදුවුණා. කලාකරුවන්/චිත්‍රපටකරුවන් ලෙස අපේ භූමිකාව සහ, මේ කතාව කියන්න අප ගත් උත්සාහය කොයිතරම් ප්‍රබලද යන්න මෙම වාර්තා චිත්‍රපටයේ අලංකෘත මාතෘකාව ප්‍රශ්නකරනවා" යැයි සිය පර්යේෂණාත්මක සහ නිර්මාණාත්මක වෑයම මෙනෙහිකරමින් කලාකරුවන් පැවසී ය. "සජීවිකරණ වාර්තා චිත්‍රපට ප්‍රභේදයේ ප්‍රතිවිරුද්ධ ගුණාංග තියෙනවා. මොකද වාර්තා චිත්‍රපට ප්‍රධාන වශයෙන් කරුණු සහ සත්‍ය තොරතුරු වාර්තාකරන අතරේ, සජීවිකරණය මාධ්‍යක් විදිහට ප්‍රබන්ධයට වඩාත් සමීපයි. මිනෙට් ද සිල්වා ඇගේ ජීවිත කාලය තුළ කෙබඳු කෙනෙක් ද කියලා හිතාගන්නත්, චිත්‍රපටයේ සමහර තාක්ෂණික සහ වාස්තු විද්‍යාත්මක අදහස් පුළුල් ප්‍රේක්ෂක පිරිසකට ගෙනියන්නත් අපේ කලාකරුවන්ගේ වාර්තා චිත්‍රපටයේ භාවිතාකරලා තියෙන රූපසටහන් සහ සජීවිකරණ අපිට උපකාර වුණා" යැයි ඔවුන් වැඩිදුරටත් පැවසී ය.

මෙම චිත්‍රපටය බ්‍රිතාන්‍ය කවුන්සිලයේ ඩිජිටල් සහයෝගීතා අරමුදලෙන් සහය ලබන අතර එය ඩිජිටල්මය නව සහයෝගීතා ක්‍රම දියුණුකිරීම උදෙසා එක්සත් රාජධානියේ සහ විදේශීය සංස්කෘතික සහයෝගීතාවයන්ට සහය දක්වයි. MMCA ශ්‍රී ලංකා විසින් පවරන ලද මෙම චිත්‍රපටයට පර්යේෂණ සහ සංවර්ධන සහය එක්සත් රාජධානියේ Forensic Architecture ආයතනය විසින් සපයන ලදී. "පුළුල් පරාසයක නිර්මාණ විෂයයන්වල සමාජීය සහ සංස්කෘතිකමය වටිනාකම ගවේෂණයකරමින්, නිර්මාණකරණය හරහා වර්තමාන ගෝලීය අභියෝගවලට විසඳුම් සෙවීමට බ්‍රිතාන්‍ය කවුන්සිලය උත්සහකරනවා. අනුබෝධවලටඅභියෝගකරමින් සමාජීය, දේශපාලනික, සහ පාරිසරික සන්දර්භයන්ට ප්‍රතිචාර දැක්වීමට ගෘහ නිර්මාණ ශිල්පය භාවිතකළ මිනෙට් ද සිල්වා පුරෝගාමී ගෘහ නිර්මාණ ශිල්පියෙකු වූවා," යැයි 'අක්කර 88' වෙත දක්වන සිය සහයෝගය පිළිබඳ කතාකරමින් ශ්‍රී ලංකා බ්‍රිතාන්‍ය කවුන්සිලයේ

අධ්‍යක්ෂක ඔර්ලැන්ඩෝ එඩ්වඩ්ස් පැවසුවේ ය. "2023/24දී එක්සත් රාජධානිය-ශ්‍රී ලංකා රාජ්‍ය තාන්ත්‍රික සබඳතාවල 75 වැනි සංවත්සරයේ කොටසක් ලෙස, ද සිල්වාගේ පරිචය පිළිබඳ ශ්‍රී ලංකාවේ ප්‍රථම ඒක පුද්ගල ප්‍රදර්ශනයට සහයදැක්වීමට සහ එහි ප්‍රතිඵල දැකීමට ලැබීම පිළිබඳව අපි සතුටු වෙනවා," යැයි ඔහු තවදුරටත් සඳහන්කළේ ය.

'අක්කර 88: මිනෙට් ද සිල්වා විසින් කළ වටපුළුව නිවාස යෝජනා ක්‍රමය' ලෝක ස්මාරක අරමුදලේ අනුමැතිය ලත්, ශ්‍රී ලාංකීය නූතන ගෘහ නිර්මාණ ශිල්පියෙකු පිළිබඳව කෙරෙන ප්‍රථම ප්‍රදර්ශනය ද වේ. MMCA ශ්‍රී ලංකා කමිටුවේ සභාපති අජිත් ගුණවර්ධන, කෞතුකාගාරය සහ WMF අතර ඇතිවූ මෙම සුවිශේෂී හවුල්කාරිත්වය පිළිබඳව මෙසේ පැවසීය, "MMCA ශ්‍රී ලංකා මේ වන විටත් විශාල නරඹන්නන් සංඛ්‍යාවක් ආකාර්ශනය කරගත් අනන්‍යවූ ප්‍රදර්ශන අත්දැකීම් අභිරක්ෂණය කරලා තියෙනවා. මෙය කෞතුකාගාරයේ පළමු ඒක පුද්ගල ප්‍රදර්ශනය. WMF වැනි ජාත්‍යන්තර සංවිධාන ගෝලීය දකුණේ ගෘහ නිර්මාණ ශිල්පීන්ගේ වැදගත්කම හඳුනාගැනීම ආරම්භකරන මේ වගේ කාලයක, ද සිල්වා වැනි කාන්තා ගෘහ නිර්මාණ ශිල්පියකු කෙරෙහි අවධානය යොමුකිරීමට වඩා හොඳ දෙයක් තවත් නෑ. කොළඹදී පැවැත්වෙන ඇගේ පළමු ඒක පුද්ගල ප්‍රදර්ශනයත් සමග බොහෝ සේ ප්‍රශංසාවට ලක්වූ මෙම ගෘහ නිර්මාණ ශිල්පියා කෙරෙහි වැඩි අවධානයක් යොමුකිරීමට කෞතුකාගාරයේ පර්යේෂණ කණ්ඩායම ප්‍රතිඥාදෙන බව අපට පෙනෙනවා".

'අක්කර 88' ප්‍රදර්ශනයේ අභිරක්ෂකයින්ගේ පර්යේෂණ-පෙරටු කරගත් අභිරක්ෂණ ක්‍රියාවලිය, ඔවුන්ව ගෘහ නිර්මාණ ශිල්පියා, ඇගේ ලියැවීම් සහ ඉගැන්වීම්, සහ වඩාත් ම වැදගත් ලෙස ඇගේ නව දිශානතීන් සොයාගැනීමේ ගමනක මෙහෙයවා ඇත. "මෙම ප්‍රදර්ශනය මිනෙට් ද සිල්වාගේ නිර්මාණ කාර්ය අභිරක්ෂණමය ලෙස ඉස්මතුකරමින් විමසීමක් රැගෙන එනවා," යැයි පැවසූ ප්‍රදර්ශනයේ සම අභිරක්ෂක රිවෙල් මර්සලින්, "එය අලුතින් නිදහස්වූ රාජ්‍යයක සන්දර්භයක් තුළ වටපුළුව නිවාස සංකීර්ණයේ මූලාරම්භය සවිස්තරාත්මකව ගවේෂණයකරන අතරේ, මහනුවර තදාසන්න ප්‍රදේශයක පිහිටි එහි සංස්කෘතිකමය වශයෙන් පොහොසත් භූගෝලීය ප්‍රදේශය හා සම්බන්ධව නිවාස සංකීර්ණය දෙස බලනවා" යනුවෙන් සඳහන් කළේ ය. ඔහු වැඩිදුරටත් පැවසුවේ, "අපට අවශ්‍ය වූයේ ගෘහ නිර්මාණ ශිල්පියෙකු, අධ්‍යාපනඥයෙකු, සහ චින්තකයෙකු ලෙස ද සිල්වා ඇගේ පරිචය තුළ නිපදවා ඇති මුල් අමුද්‍රව්‍යවලින් අපට හැකිතරම් ප්‍රමාණයක් සොයාගැනීමටයි. අපගේ පර්යේෂණයේදී චිත්‍රපට නිෂ්පාදක කණ්ඩායම සහ අභිරක්ෂක කණ්ඩායම යන දෙපිරිස ම ලෝකයේ විවිධ ප්‍රදේශවලින් පුළුල්වූ සහ විවිධවූ අමුද්‍රව්‍ය සමූහයක් සොයාගත් අතර, එය ගෘහ නිර්මාණ ශිල්පීය ව්‍යාපෘති දෙස බැලීමේ, රසවිඳීමේ, සහ පර්යේෂණකිරීමේ නව ක්‍රමයක් හඳුන්වාදී තිබෙනවා" යනුවෙනි.

'අක්කර 88: මිනෙට් ද සිල්වා විසින් කළ වටපුළුව නිවාස යෝජනා ක්‍රමය' ජොනතන් එඩ්වඩ් විසින් විශේෂයෙන් නිර්මාණ සැලසුම්කර ඇති අතර,

ප්‍රදර්ශන අනන්‍යතාවය නියා තන්ඩපානි විසින් නිර්මාණයකර ඇත. මෙම ප්‍රදර්ශනයේ කලාකරුවන්ගේ චිත්‍රපටය සමග ඡායාරූප, ප්‍රකාශන, ඓතිහාසික ලේඛන, ස්ථාපන, සහ ගෘහ නිර්මාණ ශිල්පීය සැලසුම් හා ආකෘති ඇතුළත් වේ. ‘is this an architectural documentary?’ (2023) දිනපතා අට වතාවක් තිරගතකෙරෙන අතර, ‘අක්කර 88’ 2023 නොවැම්බර් 30 සිට 2024 ජූලි 7 දක්වා මහජනයාට විවෘත වේ. “ප්‍රේක්ෂකයන්ට යෝජනා ක්‍රමය සහ ද සිල්වාගේ පරිචය වඩාත් හොඳින් තේරුම්ගැනීමට උපකාරීවන ශබ්ද ද්‍රව්‍ය, කුලියටගත් චිත්‍ර, ගෘහ නිර්මාණ ආකෘති, සහ වීඩියෝ ප්‍රදර්ශනයේ තබා ඇති කලාකෘතිවලට ඇතුළත් වනවා,” යැයි MMCA ශ්‍රී ලංකාහි සහය අභිරක්ෂක තිනාල් සජීව සඳහන්කළ අතර, ඔහු තවදුරටත් පැවසුවේ, “නරඹන්නනට ද සිල්වාගේ චින්තනය සහ ලිවීම සමග ද සම්බන්ධ වෙන්න පුළුවන්. මෙම ප්‍රදර්ශනය ගෘහ නිර්මාණ ශිල්පය සහ මිනෙට් ද සිල්වා පිළිබඳ උනන්දුවක් දක්වන හෝ සරළව ම කුතුහලයක් ඇති සියලු දෙනා ම නැරඹිය යුතු ම ප්‍රදර්ශනක්,” යනුවෙනි.

ප්‍රදර්ශනයේ අභිරක්ෂක ශාර්මිණී පෙරේයිරා සහ කලාකරුවන් වන ඉරුෂි තෙන්නකෝන්, සුමේධ කැලේගම, සහ සුමුදු අතුකෝරලගේ දායකත්වයෙන්, කෞමදී ජයවීර විසින් සංස්කරණයකරන ලද, නියා තන්ඩපානි විසින් නිර්මාණ සැලසුම්කරණයකරන ලද ‘Second Volume’ නමැති ප්‍රකාශනය ද මෙම ප්‍රදර්ශනය හා සමගාමී වේ. දකුණු ආසියානු කලා ව්‍යාපෘතිය සහ බ්‍රිතාන්‍ය කවුන්සිලය ‘Second Volume’ ප්‍රකාශනයට නොමසුරු සහාය දක්වන අතර, ද සිල්වාගේ 106 වන ජන්ම සංවත්සරයට සමගාමීව, 2024 පෙබරවාරි මාසයේදී මෙය එළිදැක්වෙනු ඇත.

ප්‍රදර්ශනයට සමගාමීව MMCA ශ්‍රී ලංකා පාසල් සහ උසස් අධ්‍යාපන ආයතනවල සිසුන් ඉලක්කකරගනිමින් නොමිලේ මහජන වැඩසටහන් සහ සමාජ සහභාගීත්වය දිරිමත්කරන වැඩසටහන් රාශියක් ද පිරිනමයි. මෙම වැඩසටහන්වලට විශේෂයෙන් අභිරක්ෂණයකළ ගැලරි කතා, වැඩමුළු, කියවීම් කණ්ඩායම්, සහ අභිරක්ෂක කණ්ඩායම, කලාකරුවන්, හා බාහිර අධ්‍යාපනඥයින් විසින් මෙහෙයවන සංචාර ද ඇතුළත් වේ. ගෘහ නිර්මාණ ශිල්පය, කලා ඉතිහාසය, ලලිත කලා, සාහිත්‍යය, සහ සමාජ විද්‍යා හදාරන සිසුන් කෙරෙහි විශේෂ අවධානයක් යොමුකිරීමට කෞතුකාගාරය සැලසුම්කරයි. සියලු ම මහජන වැඩසටහන් Foundation for Arts Initiatives, MMCA ශ්‍රී ලංකාහි ආදිකර්තෘ අනුග්‍රාහකයන්ගේ, බ්‍රිතාන්‍ය කවුන්සිලයේ, සහ Lite87හි නිර්ලෝභී සහයෙන් සිදුකෙරේ. කෞතුකාගාරයේ ප්‍රධාන පරිත්‍යාගශීලීන් සහ අරමුදල් සපයන්නන්වන ජෝන් කීල්ස් පදනම, නේශන්ස් ට්‍රස්ට් බැංකුව, සහ ෆෙයාෆස්ට් රක්ෂණ ආයතනය ද ඔවුන්ගේ නිර්ලෝභී සහයෝගය ලබාදෙයි.

මෙම ප්‍රදර්ශනයට දකුණු ආසියානු කලා ව්‍යාපෘතිය, කලා ආශ්‍රිත මුල්පිරීම් සඳහා වූ පදනම, ෆොටෝ ඩිසයින්, ඇඩ්වෙන්ට් ප්‍රොජෙක්ට්ස් ප්‍රයිවට් ලිමිටඩ්, ශ්‍රී ලංකා ගුවන් සේවය, Lite87, රිදම් FM සහ රොක් FM හි අමතර සහායත්,

බ්‍රිතාන්‍ය කවුන්සිලයේ නොමසුරු දායකත්වයත් ලැබේ. කෞතුකාගාරයේ ප්‍රධාන පරිත්‍යාගශීලීන් සහ අරමුදල් සපයන්නන්වන ජෝන් කීල්ස් පදනම, නේෂන්ස් ට්‍රස්ට් බැංකුව, ෆෙයාෆස්ට් රක්ෂණ ආයතනය සහ MMCA ශ්‍රී ලංකාහි ආදි කර්තෘ අනුග්‍රාහකයින්ගේ නොමසුරු දායකත්වය ද ලැබේ.

ශ්‍රී ලංකා නූතන හා සමකාලීන කලා කෞතුකාගාරය  (MMCA ශ්‍රී ලංකා) යනු සාමාන්‍ය ජනතාව, පාසල්, මෙන් ම සංචාරකයන්ගේ ද ප්‍රයෝජනය හා රසවින්දනය සඳහා නූතන සහ සමකාලීන කලා කෘති ප්‍රදර්ශනය, පර්යේෂණය, රැස්කිරීම, සහ සංරක්ෂණය වෙනුවෙන් කැප වූ පොදු කෞතුකාගාරයක් පිහිටුවීම අරමුණු කරගත් අධ්‍යාපනය පෙරටුකරගත්  මුලපිරීමකි. කෞතුකාගාරය දිනපතා (පෝය සහ මහජන නිවාඩු දිනවල හැර) පෙ.ව. 10– ප.ව. 6 දක්වා කොළඹ 03, ක්‍රෙස්කැට් බූලෙවාර්ඩ්හි බිම් මහලේ විවෘතව ඇති අතර, කෞතුකාගාරයට ඇතුළුවීම සහ එහි සියලු ම මහජන වැඩසටහන් නොමිලේ ය. කෞතුකාගාරය සහ, එහි ප්‍රදර්ශන හා මහජන වැඩසටහන් පිළිබඳ තොරතුරු ඔවුන්ගේ වෙබ් අඩවියෙන් www.mmca-srilanka.org/ හෝ ෆේස්බුක් facebook.com/mmcasrilanka සහ ඉන්ස්ටග්‍රෑම් instagram.com/mmcasrilanka/ පිටුවලින් ලබාගත හැක.